## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - 2014

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනතේ 10(අ)(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උප කුලපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

රු.432,800 ක් පිරිවැය වූ අත් ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් සහ මෝටර් සයිකලයක් පාවිච්චියෙන් ඉවත් කර තිබූ අතර එම අගය පොත් වලින් ලියාහැරීමට හෝ ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දක්වා ඇති රු.8,028,756 ක ණයහිමි ශේෂය තුළ වර්ෂ 05 ක් ඉක්මවූ රු.729,292 ක ශේෂයන්ද ඇතුළත් වී තිබුණි. එම ශේෂයන් නිරවුල් කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**2.2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.4 (i) වගන්තිය | පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවකදී හෝ වැඩ සඳහා වූ කොන්ත්‍රාත්තුවකදී මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක උපරිමයක් අත්තිකාරම් වශයෙන් ලබාදිය හැකි වුවත්, අත්තිකාරම් සුරක්ෂණයක් ලබාගැනීමකින් තොරව රු.189,420 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය. |
| (ආ) | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ඇමතු අංක BD/KDU/ General/ (Audit Report) දරන 2014 ඔක්තෝබර් 03 දිනැති ලිපිය | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 103 – 02-09 යටතේ අරමුදල් සම්පාදනය කරන බැවින් උපයනු ලබන සියළු ආදායම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැරකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ගාස්තු ලෙස උපයන ලද ආදායමින් රු.5,102,501 ක් සුභසාධන අරමුදලක් සඳහා වෙන්කර තිබූ බව නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| (ඇ) | 2007 ඔක්තෝබර් 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 45 3 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය හෝ පාලක මණ්ඩලය විසින් ගිණුම් සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම් සහතිකය සමඟ ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.250,842,194 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.28,486,681 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.279,328,875 ක වර්ධනයක් නිරීක්ෂණය විය. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 981 ක වර්ධනයක් වූ අතර වියදම් වැඩිවීමේ ප්‍රතිශතයට වඩා ආදායම් වැඩිවීමේ ප්‍රතිශතය ඉහළයාම ඉහත වර්ධනයට හේතුවී ඇති බව නිරීක්ෂණය විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

2014 දෙසැම්බර් 31 දිනට ආයතනයේ ස්කන්ධ ප්‍රාග්ධනය රු.4,137,205,640 ක් වූ අතර එදිනට ණය ප්‍රාග්ධනය රු.12,532,412,193 ක් විය. ඒ අනුව ස්කන්ධ ප්‍රාග්ධනයට ණය ප්‍රාග්ධන අනුපාතය සියයට 303 ක් බව අනාවරණය වූ අතර එදිනට විශ්වවිද්‍යාලයේ මුළු වත්කම් රු.17,918,290,459 ක් වූ අතර එදිනට ණය ප්‍රාග්ධනය රු.12,532,412,193 ක් විය. ඒ අනුව ආයතනයේ මුළු වත්කම් වලට ණය ප්‍රාග්ධන අනුපාතය සියයට 70 ක් බව අනාවරණය විය.

### 3.3 විශ්වවිද්‍යාලයට එරෙහිව හෝ විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර ආයතන 04 ක් විසින් රිය අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබාගැනීම, විශ්වවිද්‍යාලයට අයත් වැව් බැම්මේ අයිතිය, ඉඩමක අයිතිය ඉල්ලා සිටීම සහ සේවයෙන් පහ කිරීම වැනි කරුණුවලට අදාලව විශ්වවිද්‍යාලයට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණි.

(ආ) විනය හේතුන් මත සහ නිවාඩු නොගෙන දේශනවලට සහභාගී නොවීම හේතුවෙන් විශ්වවිද්‍යාලයෙන් ඉවත් කරන ලද කැඩෙට් නිලධාරීන් 10 දෙනෙකුට එරෙහිව එකතුව රු.3,650,000 ක වන්දි ඉල්ලා විශ්වවිද්‍යාලය විසින් නඩු 10 ක් ගොනු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි 237(ආ) පරිදි භාණ්ඩ ලැබී ඇති බවටද , අදාල බඩු ලේඛනයෙහි සහ තොග පොත යනාදියෙහි එකී භාණ්ඩ ඇතුළත් කර ඇති බවට වූ සහතිකයක් මත පමණක් ගෙවීම් කළ යුතු වුවත්, 2014 වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය විසින් මුදල් අත්තිකාරම් ගෙවීම මත රු.126,996,903 ක භාණ්ඩ හා සේවා මිලට ගෙන තිබුණි. එම අත්තිකාරම් ගෙවීම තුළ සියයට 30 සිට සියයට 100 දක්වා වූ රු.41,553,285 ක මිලදී ගැනීම් සඳහා අත්තිකාරම් ලබාදී තිබුණි. මෙම අත්තිකාරම් සඳහා ඇපකරද ලබාගෙන නොතිබුණු අතර රු.500,000 ට වඩා මිල දී ගැනීම් සඳහා ප්‍රසම්පාදන උපදෙස් මාලාවේ 8.9.1(ආ) ඡේදය

ප්‍රකාර ගිවිසුමකට එළඹිය යුතු වුවද, ඉහත එකදු මිලදී ගැනීමක් සඳහා ගිවිසුම්වලට එළඹ නොතිබුණි. මේ සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

**(i)** විශ්වවිද්‍යාලයේ පුස්තකාලයට කබඩ් හා ලී රාක්ක මිලදී ගැනීම සඳහා අවස්ථා 05 කදී මිල ගණන් කැඳවා තිබුණු අතර, දෙවන අවස්ථාවේ ලැබුණු මිල ගණන් අතුරින් රාජ්‍ය දැව සංස්ථාව සැපයුම්කරු ලෙස තෝරා ගෙන තිබියදී පිළිගත හැකි හේතු දැක්වීමකින් තොරව නැවතත් අවස්ථා 03 කදී මිල ගණන් කැඳවා තිබුණි. පස්වන අවස්ථාවේ ලැබුණු මිල ගණන් අතුරින් රමේකා හෝල්ඩින්ස් ආයතනය සැපයුම්කරු ලෙස තෝරා ගෙන රු.1,089,850 ක අගයකට ටෙන්ඩරය පිරිනමා තිබුණි. මෙම සැපයුම සඳහා ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව සියයට 30 ක අත්තිකාරම් මුදලක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. එහෙත් අදාළ භාණ්ඩ 2015 මාර්තු 31 දින වන විටත් සපයා නොතිබුණි.

**(ii)** පාඨමාලා අංක 32 හි කැඩෙට් නිලධාරීන්ට ඇඳුම් සැපයීමේදී අදාල ඇණවුමේ කොන්දේසි අනුව 2014 ජූනි 25 දින භාණ්ඩ සැපයිය යුතු බවත්, සියළු භාණ්ඩ ලැබීමෙන් පසුව මුදල් ගෙවන බව දක්වා තිබියදීත්, 2014 ජූලි 24 දින රු.721,840 ක් වූ මුළු ඇණවුම් වටිනාකමින් සියයට 20 ක අත්තිකාරම් ගෙවා තිබූ අතර භාණ්ඩ සැපයීම් කර තිබුණේ 2014 සැප්තැම්බර් 01 සිට 2015 ජනවාරි 30 අතර කාලවකවානුව තුළදී බැවින් ඇණවුම අවලංගු කිරීමට හෝ ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

**(iii)** සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශයට අවශ්‍ය ( Tria Afial Test Apparatus) උපකරණය මිලදී ගැනීම සඳහා 2013 නොවැම්බර් 07 දින පෞද්ගලික ආයතනයකින් රු.2,876,160 කට ඇණවුම් කර 2013 නොවැම්බර් 11 දින ඇණවුම් මුදලින් සියයට 30 ක් වූ රු.862,848 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. එම උපකරණය දින 60 ක කාලයක් තුළදී සපයා අවසන් කිරීමට සැපයුම්කරු එකඟ වුවද, 2015 අප්‍රේල් 22 දින වන විටත් ඉහත උපකරණයෙහි ඉතිරි කොටස් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතුවලට අදාල භාණ්ඩ වලින් ලබාගත හැකි ප්‍රයෝජන ලබාගැනීමට නොහැකිවී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 නොවිසඳි ඇති විගණන නිරීක්ෂණ

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වූ අඩුපාඩු මාගේ පූර්ව විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණු නමුත් ඊට අදාල නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට අනුබද්ධිතව වේරහැර ඉදිකර ගෙන යනු ලබන විශ්වවිද්‍යාල රෝහල සඳහා 2013 හා 2014 වර්ෂවලදී රු.10,269,253,944 ක් වියදම් දරා තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

**(i)** රෝහලේ ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමේදී විවෘත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර නොතිබුණු අතර අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ටෙන්ඩර් කමිටුවක නිර්දේශය මත විදේශීය සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් සලකා බලා ඇමෙරිකානු ඩොලර් 201,629,000 (රු.බිලියන 26) ක වටිනාකමකට පැවරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. මෙම ඉදිකිරීමට අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා භාණ්ඩාගාර ඇපකරයක් මත ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙතින් ඉහත වටිනාකමට සමාන ණය මුදලක් අනුමත කරගෙන තිබුණි.

**(ii)** ඉහත ඉදිකිරීම් කාර්යයේ උපදේශක සේවාව සඳහා මසකට රු.225,000 ක් ගෙවීමේ පදනම මත දේශීය ආයතනයක් තෝරා ගෙන තිබුණු අතර ඒ සඳහා විවෘත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර නොතිබුණි. 2014 වර්ෂය තුළදී උපදේශන සේවා ගාස්තු වශයෙන් ඉහත ආයතනය වෙත රු.1,350,000 ක් ගෙවා තිබුණි.

**(iii)** රෝහල ඉදිකර ගෙන යනු ලබන අක්කර 47 රූඩ් 37.9 ක ඉඩමෙහි හිමිකම පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

**(iv)** ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධයෙන් වූ අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

**(අ)** කොන්ත්‍රාත් පාලනය
**(ආ)** මිලදී ගැනීම්
**(ඇ)** නීති රීති රෙගුලාසිවලට අනුකූල වීම